ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 3වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

**EPU3530- ළමා සංවර්ධනය**

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2025.05.24 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) ද පමණක් පිළිතුරු සපයන්න.**

<u>01 - වන කොටස</u>

01. උපතේ සිට නව යොවුන් විය දක්වා දරුවෙකුගේ සංවර්ධනය, අවධි හතරක් ඇසුරෙන් රුසෝ පැහැදිලි කර ඇත. එම අවධි හතර (04) නම් කරන්න.

02. ප්‍රාථමික පාසල් ගුරුවරයෙකුට "ළමා සංවර්ධනය" පිළිබඳ ව පවතින දැනුවත්භාවය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිතා කළ හැකි අවස්ථා පහක් (05) ලියන්න.

03. පරිසර සාධක තුනක් (03) සඳහන් කර එම සාධක ළමා සංවර්ධනයට බලපාන ආකාරය කෙටියෙන් ඉදිරිපත් කරන්න.

04. සහජයට එරෙහිව ඇති දැඩි කිරීම යන අදහස උදාහරණයක් මගින් විස්තර කරන්න.

05. "පෙර පාසල් අවධියේ දරුවන් තුළ සියුම් චාලක කුසලතා සංවර්ධනය ඉතා වැදගත් වේ." ඉහත සඳහන් අදහස තහවුරු කිරීමට කරුණු තුනක් (03) ඉදිරිපත් කරන්න.

06. ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු වශයෙන් ඔබ පළමුවන ප්‍රධාන අවධියේ සිසුන්ගේ චිත්තවේගීය සංවර්ධනය සඳහා සැලසුම් කරන ක්‍රියාකාරකම් පහක් (05) ලියන්න.

07. හිතකර නොවන පූර්ව ප්‍රසව සංවර්ධන තත්ත්වයන් දරුවෙකුගේ පශ්චාත් ප්‍රසව අවධියට බලපාන ආකාරය කරුණු තුනක් (03) මගින් පැහැදිලි කරන්න.

08. පෙර පාසල් ගුරුවරයෙකු විසින් ශිෂ්‍යයින්ගේ හැසිරීම් ධනාත්මක ලෙස සංවර්ධනය කිරීමට අනුගමනය කළ හැකි ක්‍රම ශිල්ප පහක් (05) සඳහන් කරන්න.

ලකුණු 05 X 08 =40

09. I. "ළමයෙකුගේ සංවර්ධනයේ දී පරිසර සාධකය ආරමය සාධකයට වඩා ප්‍රබල වේ." මෙම අදහස හා ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 10 )

II. දරුවන්ගේ සමාජීය සංවර්ධනය ඇතිවන පරිදි ඔබ පන්තිකාමරය තුළ කණ්ඩායම් ක්‍රියාකාරකම් සංවිධානය කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 )

10. I. ජීන් පියාජේ Piaget' s (1954) සහ ලෙව් විගොට්ස්කි Lev Vygotsky's (1978) ඉදිරිපත් කරන ලද ප්‍රජානන සංවර්ධනාත්මක ප්‍රවේශ දෙක පිළිබඳ ව වෙන වෙනම කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

II. ඔබ ගුරුවරයෙකු ලෙස එම දෙදෙනාගේ අදහස් මුල් ළමා වියෙහි දරුවන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිතා කරන ආකාරය තර්කානුකූල ව පැහැදිලි කරන්න. (ලකුණු 10 )

11. I. භාෂා සංවර්ධනය පිලිබඳ චර්යාවාදී මතය පැහැදිලි කර ඒ පිළිබඳ ව ඔබ දරන අදහස් ඉදිරිපත් කරන්න. (ලකුණු 08 )

II. පෙර පාසල් අවධියේ දරුවන්ගේ භාෂා සංවර්ධනය සඳහා පෙර පාසල් ගුරුවරයාගේ සහ දරුවන් රැකබලා ගන්නාගේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 12 )

12. I. මුල් ළමා වියෙහි දරුවන්ගේ සාමාජීය හා චිත්තවේගීය සංවර්ධනයට ඍජු ව සහ වක්‍ර ව බලපාන සාධක පිළිබඳ ව සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

II. ළමයින්ගේ සාමාජීය හා චිත්තවේගීය අවශ්‍යතා කෙටියෙන් පැහැදිලි කර ළමයින් තුළ සමාජයීය හා චිත්තවේගීය සංවර්ධනයට සහාය වීම සඳහා වැඩිහිටියන් කටයුතු කළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 )

13. I. ගැටලුකාරී හැසිරීම් (Problem Behaviours) අර්ථ දක්වා දරුවන් වෙතින් ප්‍රදර්ශනය වන ගැටලුකාරී හැසිරීම් පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

II. අධ්‍යාපන මනෝවිද්‍යාව දන්නා ගුරුවරයෙකු ලෙස ඔබ එම ගැටලුකාරී හැසිරීම් පාලනය කිරීමට කටයුතු කරන ආකාරය පියවර වශයෙන් ඉදිරිපත් කරන්න. (ලකුණු 10 )

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*